# රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

## ණය අයදුම්පත සමඟ ඉදිරිපත් කළ යුතු ලියකියවිලි.

### නව නිවසක් /ඉඩමක් /මහල් නිවසක් මිළදී ගැනීමට හෝ ණය බේරුම් කිරීම සඳහා

**ණය අංශය සඳහා**

01)අදායම් පිලිබඳ සාක්ෂි :

(අ )ඔබගේ ආදායම වැටුප් අදායමක් නම් , සේවා කාලය , ලබන දළ වැටුප , අඩු කිරීම් හා ශුද්ධ වැටුප සහතික කරමින් , සේවා යෝජකගෙන් ලබාගත් ලිපියක් සහ පසුගිය මාස 06 සඳහා වැටුප් කුවිතාන්සි. ( PAYSHEETS)

(ආ ) ව්‍යාපාරවලින් ලැබෙන ආදායමක් නම් , ව්‍යාපාර ලියාපදිංචි සහතිකයේ පිටපතක් , පසුගිය අවු . 03 සඳහා මුල්‍ය ප්‍රකාශන , අදායම් බදු ගෙවන්නේ නම්,පසුගිය අවුරුදු 03 සඳහා බදු ගෙවූ රිසිට්පත් සහ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරන ලද ගිණුම් ප්‍රකාශන

(ඇ) ආදායම ලබන්නේ කෘෂිකාර්මික දේපළ වලින් නම් , එම දේපළ වලට අදාළ ඔප්පු පිටපතක් සහ දේශීය අදායම් දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරන ලද ගිණුම් ප්‍රකාශන .

(ඈ) කුලී ආදායමක් නම් අදාළ කුලී ගිවිසුම් සහ එම ආදායම සම්බන්ධ දේපළ / වාහන වල හිමිකම ඔප්පු කිරීම සඳහා ලිපි ලේඛන .

(ඉ) ආදායම ලබන්නේ නම් විදේශ රැකියාවක් නම් , සේවා ගිවිසුම් පිටපතක් ,සේවා කාලය හා ලබන වැටුප සනාථකරමින් , සේවායෝජකගෙන් ලබාගත් ලිපියක් ,පසුගිය මාස 06 සඳහා වැටුප් කුවිතාන්සි. (PAYSHEETS) වැටුප බැර වන බැංකු ගිණුමේ මාස 06 කා ගිණුම් ප්‍රකාශය ,ශ්‍රී ලංකාවට මුදල් එවීම සඳහන් කරන ගිණුම් ප්‍රකාශන,පාස්පෝර්ට් සහ වීසා වල සහතික කල පිටපතක්.

02)පසුගිය මාස 06 සඳහා බැංකු ප්‍රකාශන .

03) මානක සැලැස්මේ වායා පිටපතක් ( වසර 20ක් නොඉක්මවූ පළාත් පාලන ආයතනයෙන් අනුමත කරන ලද ) සහ බිම් කට්ටි සැලැස්මේ පිටපතක් (ඇත්නම්)

04) හිමිකම් ඔප්පුවේ පිටපතක් .

මිළදී ගැනීම හෝ බේරුම් කිරීම -ඇපයට තැබූ දේපළ හැර වෙනත් දේපලක් සම්බන්ධව නම් එම දේපළ වලට අදාළ පහත සඳහන් ලියකියවිලි ඉදිරිපත් කල යුතුයි.

1. සින්නක්කර ඔප්පුවේ වායා පිටපතක්.
2. මුදාහරිනු ලබන දේපළෙහි /මිලට ගැනීමට යන දේපළෙහි මානක සැලැස්මේ පිටපත් 02ක් .
3. ඉඩමට යන මාර්ගයෙහි කටු සටහන (පිටපත 02 ක්)

(05)වීථිරේඛා සහතිකයෙහි වායා පිටපතක්.

(06)අයදුම්කරු / වන්ගේ ජාතික හැඳුනුම්පතෙහි / පත්වල පැහැදිලි වායා පිටපත

(07)අයදුම්කරු/ වන්ගේ වායාරූපයක් (2”*2 ½ ” ප්‍රමාණයේ )

(08)ණය බේරා ගැනීමක් සඳහා නම් , උකස් ඔප්පුවේ සහතික කරන ලද පිටපතක් සහ ණයට ගත් මුදල , ණය මුදලේ අරමුණ ,පොළී අනුපාතිකය ,මාසික වාරිකය සහ දැනට ඉතිරිව ඇති ණය මුදල් ශේෂය සඳහන් කරමින් ණය හිමියාගෙන් ලබාගත් ලිපියක් , එය ලබාගත්තේ නිවසක් ඉදිකිරීමට නම් , අදාළ වියදම් ඇස්තමේන්තුව .

09)අරමුණු ඉඩමක් /පරිශ්‍රයක් මිළදී ගැනීමට නම් ,විකුණුම්කරුවන්ගේ සහ ජීවිත භුක්ති දරන්නන්ගේ ජාතික හැඳුනුම්පත් වල පිටපතක් /පිටපත් සහ විකිණීමට කැමැත්ත ,විකුණුම් මිල සහ ගෙවූ අත්තිකාරම් මුදල් , සඳහන් කරමින් විකුණුම් කරුවන්ගෙන් ලබාගත් ලිපියක්.

(10)ඇප දේපළට ළඟාවන මාර්ග සටහන.

**නීති අංශය සඳහා**

(01)හිමිකම් වාර්තාව,පෙළපත්සටහන ,දේපළ සම්බන්ධ උපලේඛණය - අපගේ අනුමත නිතීඥවරයෙකුගෙන් ලබාගත යුතුයි. (පිටපත 02කින්)

(02)හිමිකම් ඔප්පුව /ඔප්පු (මුල් පිටපත /පත් ) සමඟ වායාපිටපතක් .

(03)ඉඩමේ මානක සැලැස්මේ මුල් පිටපත .(අවු. 20 කට වඩා පැරණි නොවිය යුතුයි.)

(04)ඉඩම් රෙජිස්ටාර්තුමා විසින් සහතික කරන ලද ඉඩම් ලියාපදිංචි කාර්යාලයෙන් ගත් අවු.20 සඳහා වූ බැඳීම් පිලිබඳ පත් ඉරු .(මුල් පිටපත)

(05)ඇටර්නි බලපත්‍රය අදාළ නම් (මුල් පිටපත).

(06)විකුණුම් ගිවිසුමේ මුල් පිටපත හා සහතික කරන ලද පිටපත් 02ක්.

(07)ඇපයට තැබූ දේපළට අදාළ පෙර ඔප්පු /සැලසුම් තිබේ නම් ඒවා .

(08) ඇප දේපළ පිහිටා ඇති ග්‍රාම නිලධාරී වසම සහ ප්‍රාදේශීය ලේඛම් කොට්ඨාසය සහතික කරමින් ග්‍රාම නිලධාරිතුමාගෙන් ලබාගත් ලිපියක්.

**පහත සඳහන් ලියවිලි ඉඩම පිහිටා ඇති ප්‍රදේශයේ පළාත් පාලන ආයතනයකින් ලබා ගත යුතුය.**

09) හිමිකම් සහතිකය

10) වීථි රේඛා සහතිකය (මුල් පිටපත )

11) නොපවරාගැනීමේ සහතිකය (මුල් පිටපත)

12) අන්තිම කාර්තුව සඳහා වරිපනම් බදු කුවිතාන්සිය (මුල් පිටපත)

13) වරිපනම් දැන්වීම (මුල් පිටපත)